ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
Human Rights Commission of Sri Lanka

මාධ්‍ය නිවේදන අංක: HRC/P/i/S/21/04/23

# මාධ්‍ය නිවේදනය

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතාගේ පෞද්ගලික නිවස 2022.07.09 වන දින ගිනි තැබීම සිදුවන අවස්ථාවේදී ප්‍රමාණවත් ආරක්ෂාවක් ආරක්ෂක අංශ විසින් සැපයූවාද යන්න පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පවත්වන පරීක්ෂණය සඳහා අද දින ද පාර්ශවයන් කැඳවන ලදී. මෙම පරීක්ෂණය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව යන පාර්ශවයන් කැඳවා තිබිණි. ඒ අනුව ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව මෙම පරීක්ෂණයට පැමිණ කරුණු දැක්වීම සිදුකරන ලද අතර, ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් කරුණු දැක්වීම සඳහා ඉදිරියේ දිනයක් ලබාදෙන ලෙස ලිඛිත ඉල්ලීමක් සිදුකරන ලදී. එම ඉල්ලීම සැළකිල්ලට ගෙන ඉදිරි දිනයකදී මෙම පරීක්ෂණයට අදාළව කරුණු දැක්වීම සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව කැඳවීමට නියමිතය.

මාධ්‍ය ප්‍රකාශක
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2023.04.21